**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 10/95**

මගේ අංකය: III/0266/2/68/එල්/එච්/ඒ-6
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය ,නිදහස් චතුරශ්‍රය ,
කොළඹ 07.
1995 මාර්තු 15 දින

සියලුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ආයතන සංග්‍රහයට සංශෝධන - වැටුප් ණය - XXIV පරිච්ඡේදය</u>**

ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 7:4 උප වගන්තියට පසුව පහත සඳහන් උපවගන්තිය එකතු කිරීමෙන් ආයතන සංග්‍රහය සංශෝධනය කරනු ලැබේ

7:4:1 සුදුසුකම් සපුරා ඇතත් වැටුප් අවකරන සීමාව නිසා සුදුසු ඇපකරුවකු සොයා ගැනීමට අපහසු වන අවස්ථාවලදී ඒ සඳහා ඉහත සුදුසුකම් සපුරා ඇති ඇපකරුවන් දෙදෙනෙකුට ඇප විය හැකිය. යම් අවස්ථාවක ප්‍රධාන ඇපකරු විසින් නොගෙවා ඇති ණය මුදල හා ඒ සඳහා වන පොලිය ද සමභාග වශයෙන් ගෙවීමට ඇපකරුවන් දෙදෙනා විසින් වෙන වෙනම බැඳී සිටින ලෙසට බැඳුම්කරයකට අත්සන් කලයුතු ය. ඒ සඳහා සුදුසුකම් ඇති ඇපකරුවන් ණය කරු විසින් ඉදිරිපත් කලයුතුය.

02. මේ සම්බන්ධයෙන් භාවිතා කලයුතු පොදු 158 (අ) ආකෘති පත්‍රය මෙම චක්‍රලේඛයට අමුණා ඇත.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු
කටයුතු අමාත්‍යාංශය

**<u>සියළු දෙනාම විසින් මෙයින් දැනගත යුතුයි</u>**

ප්‍රධාන ණයකරු වශයෙන් (මෙහි මින්මතු "ප්‍රධාන ණයකරු" යයි කියනු ලබන) දැනට .................................................................................................................................
දෙපාර්තමේන්තුවෙහි නියුක්ත .................................................................................................................
.............................................. පදිංචි .................................................................................................
වන මම ද, ඇපකාරයන් වශයෙන් (මෙහි මින්මතු "ඇපකරුවන්" යයි කියනු ලබන) .................................................................................පදිංචි .............................................
.................................................................... හා .........................................................................
...................................................................... පදිංචි .........................................................
...................................................................... වන අප ද, (මෙහි මින් මතු "ආණ්ඩුව" යයි හඳුන්වනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුව ඉල්ලූ විටෙක එකී ජනරජයේ වලංගු මුදලින් රුපියල් .................................................................................................................
නිසි ලෙස හා සත්‍ය ලෙස කොළඹ දී එකී ආණ්ඩුවට ගෙවන බවට අප තිදෙනා එක්ව ද වෙන් වෙන්ව ද, මෙයින් තරයේම බැඳෙන අතර පිළිවෙලින් අප එක් එක්කෙනාගේ උරුමක්කාර, පොල්මඃකාර, අද්මිනිස්ත්‍රාසිකාරයන් සියළු දෙනා එක්ව ද ඔවුන් එක් එක්කෙනා වෙන් වෙන්ව ද මෙයින් බැඳී තබමු.

තව ද, එකී ඇපකරුවන් වන .............................................................................................
.................................................................... හා .........................................................................
.................................................................. අප මෙසේ බැඳෙන්නේ බෙනිජිකියුම් ඔර්ඩිනිස් ඩිවිසියෝනිස් එට් එක්ස්කසියෝනිස් නමැති කොටස වශයෙන් හා පිළිවෙලින් අයකර ගැනීමේ ප්‍රයෝජන ද නීතිය අනුව අපකරුවන්ට හිමි සෙසු ප්‍රයෝජන, වරප්‍රසාද හා ව්‍යාතිරේකයන් ද මෙයින් අත්හැර දමමිනි. එකී පාඨයේ අර්ථය, බලය හා එම වාසිය අත්හැර දැමීමේ විපාකයන් අපගේ නීතිඥ .........................................................................................................................
මහතා විසින් ඇපකරුවන් වන අපට තේරුම් කර දෙන ලදින් දැන් අපි එහි යථාර්ථය සම්පූර්ණයෙන්ම අවබෝධ කරගෙන ඇති බව ද මෙයින් ප්‍රකාශ කර සිටිමු.

වර්ෂ 199.......................... ක් වූ .................................. මස ..............................
වැනි දින වන මෙදින ................................................................ දී අත්සන් කරන ලදී.

එකී ආණ්ඩුවේ සේවයෙහි නියුක්ත නිලධාරියෙකු වශයෙන් තමා ලබන වැටුපෙන් මාස්පතා කපා ගතහැකි වන කොටස් වශයෙන් වර්ෂයකට සියයට ......................................
බැගින් වූ පොලියකුත් සමඟ ආපසු ගෙවීමේ ප්‍රකාශිත පොරොන්දු පිට ................................
........................................................................................සඳහා ප්‍රධාන ණයකරු විසින් එකී ආණ්ඩුවෙන් ණයක් ලබාගෙන ඇති හෙයින් ද,

එසේම, එකී ............................................................................................................ හා
............................................................................................. වන අපි, එකී පොරොන්දුව පරිදි ලබාගත් ණය ගෙවීම සඳහා ඇපකරුවන් වීමට එකඟ වී ඇති හෙයින් ද,

ඉහත කී බැඳුම්කරයේ හෙවත් බන්ධන පත්‍රයේ වග හැටිනම්, ඉදින්, ප්‍රධාන ණයකරු විසින් යට කී පරිදි ණයට ගන්නා ලද එකී මුදල, ඉහත කී පොලියත් සමග රුපියල් ................. ............................................................................. බැගින් වූද ඔහුගේ වැටුපෙන් කපාගත හැක්කා වූද මාසික කොටස් ......................... කින් නිසි ලෙස හා සත්‍ය ලෙස එකී ආණ්ඩුවට ගෙවුවහොත් හෝ සේවයෙන් අස් කිරීම හෝ ඉල්ලා අස්වීම හෝ වෙන යම් කරුණක් හෝ හේතු කොට ගෙන ඔහු එකී නිලයෙන් ගිලිහුනේ නම් ප්‍රධාන ණයකරු විසින් හෝ ඔහුගේ ඇපකරුවන් විසින් හෝ, එකී ණය මුදලෙන් ප්‍රධාන ණයකරු විසින් ගෙවිය යුතුව ඉතිරි වී තිබෙන මුල් මුදල එවකට හිඟව තිබුණා වූද ගෙවිය යුතු වූද පොලියත් සමඟ සම්පූර්ණයෙන් එකී ආණ්ඩුවට ගෙවුවහොත් එවිට මේ බැඳුම්කරය හෙවත් බන්ධන පත්‍රය නිරර්ථක හා බල රහිත වන බව හා එසේ නොගෙවුවහොත් මේ බැඳුම්කරය හෙවත් බන්ධන පත්‍රය සම්පූර්ණ බල සහිතව ද, වලංගු වද ක්‍රියාත්මකවද පවතින බවය.

මීට සාක්ෂි පිණිස මෙහි සඳහන් පාර්ශවකාරයන් විසින් වර්ෂ 199........................ ක්වූ ............................ මස .......................... වැනි මෙදින මේ බැඳුම්කරයට අත්සන් කරන ලදී.

ප්‍රධාන ණයකරුගේ අත්සනට සාක්ෂි:

1. ..........................................

2. ..........................................

..........................................
ප්‍රධාන ණයකරුගේ අත්සන

1 වන ඇපකරුගේ අත්සනට සාක්ෂි:

1. ..........................................

2. ..........................................

..........................................
1 වන ඇපකරුගේ අත්සන

2 වන ඇපකරුගේ අත්සනට සාක්ෂි:

1. ..........................................

2. ..........................................

..........................................
2 වන ඇපකරුගේ අත්සන